# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ලඝුලේඛක (ඉංග්‍රීසි) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන -

1.1 දෙපාර්තමේන්තුව -රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
යොමු අංකය- PSC/ADM/12/08/03 දිනය -2017.08.01

1.2 අමාත්‍යාංශය - අදාල නැත

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය - DMS/1011 දිනය -2016.05.04

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල් නිර්දේශය -
යොමු අංකය - EST-2/03/REC/6702 දිනය -2016.11.09

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ
යොමු අංක - NSCC/9/85/SR දිනය -2016.10.13
2017.07.13

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය - PSC/EST/05-01-52/01/2017 දිනය -2017.08.10

**02.** පත්කිරීම් බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

**03.** පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

ආයතනයේ විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වුවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූද, ඒකල ස්වරූපයේ වූද(Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂ කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුයි.

**04.** තනතුරේ ස්වභාවය -

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කල තනතුරක් වන අතර ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

**05.** වැටුප් -

මාසික දීමනාව - රු. 15,924/-
ගැලපුම් දීමනාම - රු. 9,914/-
ජීවන වියදම් දීමනාව - රු. 7,800/-

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යය

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| ලඝුලේඛක (ඉංග්‍රීසි) | 01 | කොමිෂන් සභාවේ කාර්යය සටහන් ලඝුලේඛනය කර යතුරු ලියනය කිරීම හා ආයතන ප්‍රධානියා විසින් පවරන අනිකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධාරි සංඛ්‍යාව - 01

07. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

7.1 සුදුසුකම්

7.1.1 අධ්‍යාපන සුදුසුකම් -

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

(ආ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස්පෙල) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) සාමාන්‍ය පොදු පරික්ෂණය හැර සමත්ව තිබීම.

7.1.2 වෘත්තිය සුදුසුකම් -

තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝුලේඛනය පිළිබඳ මාස 06 කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදාරා තිබීම.

7.1.3 පළපුරුද්ද - අදාළ නොවේ

7.1.4 කායික සුදුසුකම් -

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.1.5 වෙනත්

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්තවිය යුතුය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1.1 හා 7.1.2 හි දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2 වයස

7.2.1 අවම සීමාව - අවුරුදු 18 නොඅඩු

7.2.2 උපරිම සීමාව - අවුරුදු 45 නොවැඩි

7.3 බඳවා ගැනීමේ ක්‍රමය - වෘත්තීය පරීක්ෂණයක් මඟින්

7.3..1 වෘත්තීය පරීක්ෂණය (ඇමුණුම 01)

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ලඝු ලේඛනය(ඉංග්‍රීසි) | 100 | 40 |
| යතුරු ලියනය(ඉංග්‍රීසි) | 100 | 40 |

7.3.1.1 පවත්වන බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

7.3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :

බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම.

7.3.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා -
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

සටහන:

I බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත වෘත්තීය පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කෙරෙනු ඇත.

II වෘත්තීය පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කර බලා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

7.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය -

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරිම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරිම හා වෙබ් අඩවියේ දැන්වීම් පල කිරිම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

8. කාර්යක්ෂමතා කඩඉම් - අදාල නොවේ.

9. භාෂා ප්‍රවීණතාව - අදාල නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම - අදාල නොවේ.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිභාහිර වන්නා වූ කොන්දේසි - අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ - අදාල නොවේ

13. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

14. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ - අත්සන ..........................
(විෂය භාර නිලධාරි)
නම -
තනතුර -
දිනය - 2017. 08. 21

පරික්ෂා කලේ - ..........................
විෂය භාර මාණ්ඩලික නිලධාරියා
නම-
තනතුර - පද්මසිරි ජයවික්‍රම
දිනය - 2017 08. 25
නිර්දේශ ඉදිරිපත් කරමි.

අත්සන - ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම -
තනතුර -
නිල මුද්‍රාව -
ඒ. කුලතුංග
අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය)
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177 නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ - 05.

යොමු අංකය -PSC/ADM/12/08/03

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 නිලධාරි ගණය ලසුලේඛක (ඉංග්‍රීසි) තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන - ..............................

නම - ..................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය --------------------------

---

යොමු අංකය - PSC/EST/05-01-52/01/2017

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ (02) සේවා ගණයේ ලසුලේඛක (ඉංග්‍රීසි) තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2017/08/10 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන් ------------------------------

නම - එච්. එම්. ගාමිණි සෙනෙවිරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එච්. එම්. ගාමිණි සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

දිනය: 2017/08/29

නිල මුද්‍රාව:

ඇමුණුම - 01

01. විභාගයේ නම - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණයේ ලඝුලේඛක(ඉංග්‍රීසි) තනතුරට බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර -

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | ලඝුලේඛනය (ඉංග්‍රීසි) | විනාඩි 45 | 100 | 40 |
| 02 | යතුරු ලියනය ඉංග්‍රීසි) | විනාඩි 20 | 100 | 40 |

03. පවත්වන බලධාරියා - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාග පවත්වනු ලැබේ.

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව - පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය -

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | ලඝු ලේඛනය (ඉංග්‍රීසි) | මිනිත්තු 05 ක් තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 60 ක වේගයෙන් ලඝු සටහනින් ලියා එම සටහන් මිනිත්තුවකට වචන 08 ක වේගයෙන් සාමාන්‍ය ආකාරයට ලිවීමේ හැකියාව මැන බැලීමේ පරීක්ෂණයකි |
| 02 | යතුරු ලියනය (ඉංග්‍රීසි) | වචන 400 ක් පමණ වූ පාඨයක් නිවැරදිව මිනිත්තු 20 ක් ඇතුලත මිනිත්තුවකට වචන 20 ක වේගයෙන් යතුරු ලියනය කිරීමේ හැකියාව මැන බැලීමේ වෘත්තීය පරීක්ෂණයකි. |

සකස් කලේ -

අත්සන ..........................

(විෂය භාර නිලධාරි)

නම - ..........................

තනතුර - ..........................

දිනය - 2017/08/21

පරීක්ෂා කලේ -

අත්සන ..........................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නම ..........................

තනතුර - ..........................

දිනය - ..........................

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අත්සන ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම -

තනතුර -

දිනය -

නිල මුද්‍රාව -

ඒ. කුලතුංග
අතිරේක ලේකම් (පාලන හා මූල්‍ය)
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ - 05.